**ශීර්ෂය 252 - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 252 - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 26 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූනි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් 4 ක් සඳහා සලසා තිබුණු එකතුව රු. 12,200,000 ක ප්‍රතිපාදන වල සියයට 100 ක ඉතිරියක් නිරීක්ෂණය විය. | 2021.12.21 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2021 සහ 2022.04.26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 වියදම් කළමනාකරණ චක්‍රලේඛ පරිදි වත්කම් මිලදීගැනීම අත්හිටුවා තිබීම,වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම, කෝවිඩ් වසංගතය හේතුවෙන් ව්‍යාපෘතිය මාර්ගස්ථව සිදු කිරීම හා දීමනා ගෙවීම සඳහා වැටුප් හා සේවක නිර්ණන කොමිෂන් සභාවේ අනුමැතිය හිමි නොවීම වැනි හේතු ප්‍රතිපාදන ඉතිරියට බලපා ඇති බව වාර්තා කර තිබුණි. | මු.රෙ. 50 ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු නිවැරදිව හා තාර්කිකව පිළියෙල කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වැය විෂයයන් 26 ක එකතුව රු. 1,611,772,695 ක් වූ ප්‍රතිපාදන මුදලින් සමාලෝචිත වර්ෂය අවසන් වන විට එකතුව රු. 514,229,950 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු අතර එය එක් එක් වැය විෂයය වෙනුවෙන් සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 3 සිට සියයට 95 දක්වා පරාසයක බව නිරීක්ෂණය විය. | 2022/04/26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ 3/2022 ට අනුව වියදම් සීමාකිරීම, විදේශ විනිමය අර්බුදය, නිලධාරීන්ගේ ගෙවීම් සඳහා වැටුප් සහ සේවක කොමිෂන් සභාවේ අනුමැතිය නොලැබීම සහ සිව්වන කාර්තුව සඳහා ප්‍රතිපාදන නොමැතිවීම හේතුවෙන් ප්‍රතිපාදන මාරුකිරීම නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | මු.රෙ. 50 ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු නිවැරදිව හා තාර්කිකව පිළියෙල කළ යුතු වීම. |
| (ඇ) | මුදල් රෙගුලාසි 66/69 විධි විධාන ප්‍රකාරව වැය විෂයයන් 03 ක එකතුව රු.9,469,000 ක ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන් 07 ක් වෙත මාරු කර තිබුණි. එහෙත් එම වැය විෂයයන් 07 හි එකතුව රු. 23,200,605 ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය අවසානයට ඉතිරි කර තිබුණු අතර එය අදාල වැය විෂයයන්ගේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 19 ත් සියයට 70 ත් අතර පරාසයක විය. | 2021.12.06 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 02/2021 හා 2021.12.21 දිනැති අයවැය චක්‍රලේඛ අංක 03/2021 අනුව කාර්තුමය පදනමක් මත ප්‍රතිපාදන ලබාදීම සහ වාර්ෂික ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙහි ඉතිරි වීම් සිව්වන කාර්තුව සඳහා භාවිතා කිරීමට අවසර ලබා නොදීම මත වැය විෂයන් අතර ප්‍රතිපාදන මාරු කිරීමට සිදු වීම නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | මු.රෙ. 50 ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු නිවැරදිව හා තාර්කිකව පිළියෙල කළ යුතු වීම**.** |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මියගිය නිලධාරින් 3 දෙනෙකුට අදාල එකතුව රු.453,130 ක් හා සේවය හැරගිය නිලධාරීන් 9 දෙනෙකුට අදාල එකතුව රු. 489,984 ණය ශේෂ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද අපොහොසත් වී තිබුණි. | මිය ගිය නිලධාරීන්ගේ ණය ශේෂ මරණ පාරිතෝෂිකය ප්‍රදානය කල පසු නිරවුල් කිරීමට නියමිත බව හා සේවය හැර ගිය නිලධාරීන්ගේ ණය ශේෂ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග හා ඉදිරියට ගැනීමට යෝජිත ක්‍රියා මාර්ග වාර්තා කර තිබුණි. | ණය ශේෂ නිරවුල් කිරීමට කඩිනම් පියවර ගතයුතු බව. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නිරීක්ෂණය | | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම | | |
| | | රු. | | | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | | |
| (අ) | **මු.රෙ.102 සිට 109** | - | 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව, අයිතම 480 ක ඌනතාවයක් පැවතුණ ද මේ පිළිබඳව සමාලෝචිත වර්ෂය අවසානය වන තෙක් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණයේදී ඌණතා සම්බන්ධයෙන් මු.රෙ. 102 - මු.රෙ.109 පරිදි අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනිමට කටයුතු කරනු ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | **මු.රෙ. 340** | - | උප පත්‍රිකා පොත් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | ඉදිරියේදී කටයුතු කිරීමට නියමිතය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | **මු.රෙ. 891** | - | ඇප තැන්පත් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ඇප තබා ගැනීමට කටයුතු කරමින් පවතින අතර ඒ අනුව ඉදිරියේදී ඇප තැන්පත් ලේඛනය පවත්වා ගෙන යනු ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **දැක්ම හා මෙහෙවර**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දත්ත වාර්තා 11 ක් විගණිත දිනය වන 2023 අප්‍රේල් 24 දින වන විටත් මුද්‍රණය කර නොතිබූ අතර එහි ප්‍රමාද කාලය නියමිත දිනයට වඩා මාස 01 ත් 1.5 ත් අතර විය. | ඉතා හදිසි ජාතික අවශ්‍යතාවයක් ව පවතින "ආර්ථික අර්බුදයේ බලපෑම පිළිබඳ ගෘහ ඒකක සමීක්ෂණය" හි සැලසුම් කටයුතු සඳහා ප්‍රමුඛතාවය දී කටයුතු කිරීමට සිදුවූ බැවින් නියැදි සමීක්ෂණ අංශය කාර්ය බහුල වීම මත මෙම ප්‍රකාශනය ප්‍රකාශයට පත් කිරීමේ දී සුලු ප්‍රමාදයක් ඇති වීම, දත්තවල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමට අපේක්ෂිත කාලයට වඩා වැඩි කාලයක් ගතවීම, 2021 ජාතික ගිණුම් වාර්ෂික වාර්තාවද නව මුහුණුවරක් ගතයුතු බව තීරණය කළ බැවින් 2021 වර්ෂයේ වාර්තාව නිකුත් කිරීම ප්‍රමාද කිරීමට සිදුවීම හා COVID – 19 වසංගත තත්ත්වය හේත්වෙන් ප්‍රමාදවීම් සිදු වි ඇති බව දන්වා තිබුණි. | නියමිත දින වකවානු තුළ දත්ත නිකුත් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | දත්ත වාර්තා 24 ක් 2023 අප්‍රේල් 24 දින දක්වාත් වෙබ් අඩවියට නිකුත් කර නොතිබුණ අතර දත්ත වාර්තා 12 ක් වෙබ් අඩවියට නිකුත් කර තිබුණේ නියමිත දිනයට වඩා මාස 01 ත් මාස 20 ත් අතර කාල පරාසයක ප්‍රමාදයකින් පසුව බව නිරීක්ෂණය විය. | ඉතා හදිසි ජාතික අවශ්‍යතාවයක් ව පවතින "ආර්ථික අර්බුදයේ බලපෑම පිළිබඳ ගෘහ ඒකක සමීක්ෂණය" හි සැලසුම් කටයුතු සඳහා ප්‍රමුඛතාවය දී කටයුතු කිරීමට සිදුවූ බැවින් නියැදි සමීක්ෂණ අංශය කාර්ය බහුල වීම මත මෙම ප්‍රකාශනය ප්‍රකාශයට පත් කිරීමේ දී සුලු ප්‍රමාදයක් ඇති වීම, දත්තවල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමට අපේක්ෂිත කාලයට වඩා වැඩි කාලයක් ගතවීම, 2021 ජාතික ගිණුම් වාර්ෂික වාර්තාවද නව මුහුණුවරක් ගතයුතු බව තීරණය කළ බැවින් 2021 වර්ෂයේ වාර්තාව නිකුත් කිරීම ප්‍රමාද කිරීමට සිදුවීම හා COVID – 19 වසංගත තත්ත්වය හේත්වෙන් ප්‍රමාදවීම් සිදු වි ඇති බව දන්වා තිබුණි. | නියමිත දින වකවානු තුළ දත්ත නිකුත් කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කෘෂිකාර්මික අංශයට අදාල වාර්තා සම්බන්ධයෙන් දත්ත මුදාහැරීමේ ඉදිරි දින සටහන් හා දත්ත මුදාහැර තිබූ දිනයන් සම්බන්ධයෙන් අදාල තොරතුරු කෘෂිකාර්මික හා පාරිසරික අංශයෙන්, පර්යේෂණ හා විශේෂ අධ්‍යයන අංශයට ලබා දී නොතිබුණි. | ඉදිරියේදී ඇතුලත් කිරීමට සටහන් කරගත් බව කාරුණිකව දන්වමි. | අදාල තොරතුරු නියමිත කාලය තුල ලබා දිය යුතු වීම. |

## 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | කෙටුම්පත් වාර්ෂික කාර්යසාධන වාර්තාව අනුව දෙපාර්තමේන්තුවේ අංශ 13 ක් විසින් ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් අපේක්ෂිත නිමවුම් මට්ටම් ළගා කර ගෙන නොතිබුණු අතර ඒවායේ කාර්යයන් ඉටු කිරීමේ ප්‍රගතිය සියයට 15 ක සිට සියයට 90 ක් දක්වා පරාසයක පැවැතුණි. තවද 2023 අප්‍රේල් 06 වන දින විගණනය වෙත ලබාදුන් වාර්ෂික කාර්යසාධන වාර්තාවේ මෘදු පිටපතට අනුව සෞඛ්‍ය අමාත්‍යාංශයේ පිහිටි සංඛ්‍යාලේඛන අංශයේ කාර්යයන් 03 ක හා කම්කරු දෙපාර්තමේන්තුවේ පිහිටි සංඛ්‍යාලේඛන අංශයේ කාර්යයන් 02 ක තත්‍ය නිමැවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස සියයට 75% ට වඩා | සියලුම ලිපි ලේඛන හා උපකරණ බෙදාහැරීමට සැලසුම් කර තිබුණ ද වර්ෂය තුළ සිදු වූ ඉන්ධන මිල ගණන් ඉහළ යාම හේතුවෙන් පැවති ප්‍රතිපාදන මත 2022 වර්ෂයේදී බෙදා හැරීම සිදු කල හැකි වූ උපකරණ පමණක් බෙදාහැරීම සිදු කිරීම, COVID-19 හා ඇති වූ ආර්ථික අර්බුදය නිසා සියලුම කාර්යයන්හි කාල රාමුව සංශෝධනය වීම, එම වර්ෂය තුල දී වරින් වර විදුලිය විසංධි කිරීම් හේතුවෙන් අඛණ්ඩව අන්තර්ජාල පහසුකම් ලබාදීමට නොහැකි වීම, මුද්‍රණ යන්ත්‍ර සහායක තනතුර පුරප්පාඩු වීම, රටේ පැවති අර්බුදකාරී තත්වය හමුවේ ඉන්ධන ලබාගැනීම සීමාකර තිබූ හෙයින් 2022 වසරේ සැලසුම් කර තිබූ ක්ෂේත්‍ර අධීක්ෂණ කටයුතු ඉටුකිරීමට නොහැකි වීම, ඇතැම් සමීක්ෂණය හා සම්බන්ධව ගෙවීම් කටයුතු | සැලසුම් කළ පරිදි කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| අඩු මට්ටමක පැවතුණ බව නිරීක්ෂණය විය. | නිම කිරීමට අපේක්ෂා කළ ද, අදාල අනුමැතීන් 2022 වර්ෂය තුළ දී නොලැබීම, අයවැය චක්‍ර ලේඛ මඟින් රාජ්‍ය වියදම් සීමා කිරීම, කඩදාසි හිගය හේතුවෙන් අපේක්ෂිත මට්ටම ඉටුකිරීමට නොහැකි වීම, තිරසර සංවර්ධන අරමුණු 16 යටතේ පවතින දර්ශක ගණනය කිරීම සඳහා ක්‍රමවේදයක් අවශ්‍ය බැවින් මූලික කටයුතු අවසන් කොට සමීකෂණය පැවැත්වීම සඳහා රුපියල් මිලියන 10 ක මුදලක් ඇස්තමේන්තු ලෙස ඉදිරිපත් කළද, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන නොලැබුණ බැවින් වර්ෂය තුළ සිදු කිරීමට සැලසුම් කළ පරිදි අදාල කාර්යයන් සිදු කිරීමට නොහැකි වීම, වැනි හේතුන් සහ ගැනීමට යෝජිත ක්‍රියාමාර්ග වාර්තා කර තිබුණි. | |

## 3.3 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අංක 4.1.1 ප්‍රකාරව ප්‍රසම්පාදනයක් නියමිත කාලය තුල අවසන් කරන බවට සහතික වීම පිණිස , සම්පූර්ණ ප්‍රසම්පාදන ක්‍රියාවලිය කාර්යක්ෂම ලෙස සැලසුම් කළ යුතු වුවත් ජන හා නිවාස සංගණනය - 2021 සඳහා බෑග් මිලට ගැනීමේ කාර්යයන් සැලසුම්ගත පරිදි ඉටු වී නොතිබුණි. 2020 | දෙපාර්තමේන්තුවේ 2020 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට අනුව ජන හා නිවාස සංගණනය 2021 සඳහා බෑග් මිලදී ගැනීමේ කාර්යයන් සිදුකිරීමට පහත පරිදි අපේක්ෂා කර තිබිණි.<br><br>ලංසු ඉදිරිපත් කළ යුතු දිනය - 2020.07.15<br>ප්‍රදානය කළ යුතු දිනය - 2020.09.04<br>සම්පූර්ණ කරන දිනය - | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අංක 4.1.1 ප්‍රකාරව ප්‍රසම්පාදනය නියමිත කාලය තුල අවසන් කළ යුතු බව. |

| | | |
|---|---|---|
| ජූලි, 2021 ජනවාරි හා 2022 අගෝස්තු මාස වලදී මිල ගණන් කැඳවීම් කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් අදාල ප්‍රසම්පාදනය නිම වී නොතිබුණි. යථෝක්ත ප්‍රසම්පාදනය, ප්‍රසම්පාදන සැලැස්මට අනුව 2020 නොවැම්බර් 27 දින අවසන් කළ යුතු වුවද, කාලීනව සැලසුම්ගත පරිදි එය සිදු නොවීම හේතුවෙන් වෙලදපළ මිල වැඩිවීම නිසා දෙපාර්තමේන්තුවට වැඩි පිරිවැයක් යටතේ ඉදිරියේ මිලදී ගැනීමට සිදුවන බව නිරීක්ෂණය කෙරේ. | 2020.11.27<br>ගෙවීම් සිදුකරන දිනය - 2020.12.27<br><br>රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අංක 4.1.1 ප්‍රකාරව ප්‍රසම්පාදනය නියමිත කාලය තුල අවසන් කරන බවට සහතික වීම පිණිස සම්පූර්ණ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සැලසුම් කලද 2020 වර්ෂයේ දි සැපයුම්කරුවන් සැපයු සාම්පල පිරිවිතර හා එකඟ නොවීම, 2021 දී සළුසල ආයතනය විසින් ගිවිසුමට පටහැනි ලෙස කටයුතු කිරීම ඉහත ප්‍රසම්පාදනය සිදු කරන කාලපරිච්ඡෙදය තුල සිදුවූ කොවිඩ් වසංගත තත්ත්වය හා ආර්ථික අර්බුදතා තත්ත්වය යන හේතුන් මත මෙම බෑග් ප්‍රසම්පාදන කටයුත්ත නියමිත කාලය තුල කල නොහැකිවී ඇති බව කාරුණිකව පෙන්වා දෙමි. | |

## 3.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දී මුද්‍රණ අංශයේ දෙමහල් ගොඩනැගිලි 02 ක ඉහල මහල් අලුත්වැඩියා නොකිරීම නිසා එම උඩුමහල් 2 හි වර්ග අඩි 6856 ක පරිශ්‍රය භාවිතයට නොගෙන නිශ්ක්‍රීයව පැවතුණි. | වහල බිඳී යාම නිසා අලුත්වැඩියා කළ යුතු තත්වයක පවතී. | අලුත්වැඩියාව සිදු කර භාවිතයට ගැනීම හෝ අතිරික්ත නම් වෙනත් පාර්ශවයකට ලබා දීම සිදු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2014 ජනවාරි 11 වන දින අනතුරට පත් කැබ් රථයක් වාර්තාවේ දිනය වන විටත් ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ගාල්කර පවතින අතර පූර්ණ රක්ෂණ ආවරණයක් ලබාගෙන තිබූ මෙම වාහනයට බරපතල හානි සිදු වී ඇති බවත් යථා තත්ත්වයට පත්කල නොහැකි බවත් දේශීය නියෝජිත ආයතනය විසින් දන්වා තිබිය දී ත් පූර්ණ රක්ෂණ වන්දිය ලබාගැනීමට කටයුතු කිරීමෙන් තොරව පෞද්ගලික ගරාජයකින් අළුත්වැඩියාව සිදු කර රක්ෂණ ආයතනයෙන් රු. 1,514,625 ක වන්දියක් ලබා දී තිබුණි. මෙම අළුත්වැඩියාවෙන් පසුව ද වාහනය ධාවනය තත්ත්වයේ නොමැති බැවින් තව දුරටත් ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ගාල්කර පවතින බව නිරීක්ෂණය විය. | 2023.03.22 වන දින මුදල් අමාත්‍යාංශයේ දී පැවති විගණන කමිටු රැස්වීමේදි සාකච්ඡා කර ගත් පරිදි අප දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය හා මුදල් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය එක්ව ලිපි ගොනු අධ්‍යනය කර වාර්තාවක් ලබා දීමෙන් පසු ඉදිරි කටයුතු සිදු කිරිමට සැලසුම් කර ඇත. එමෙන්ම අදාල වාහනය මාර්ගයේ භාවිතා කිරිමට නොහැකි බව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇති බැවින් අපහරණ කමිටුවක් පත් කර එහි වාර්තාව පදනම් කර ගනිමින් අදාල වාහනය පුහුණු කටයුතු සඳහා ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරිය වෙත ලබා දීමට යෝජනා වි ඇත. අදාල අපහරණ කමිටුව මේ වන විටත් පත් කර ඇත. | විධිමත් පරීක්ෂණයක් පවත්වා වගකියයුතු පාර්ශවයන් හඳුනාගෙන විනයානුකූලව කටයුතු කිරීම |
| (ඇ) | ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ හත්වන මහලේ බටහිර අංශයේ ¾ ක් පමණ ඉඩ ප්‍රමාණයක් ගොඩනැඟිල්ල ඉදිකළ දිනයේ සිට විගණිත දින දක්වා කිසිදු භාවිතයකට ගෙන නොතිබුණි. හත්වන මහල බටහිර සම්පූර්ණ කොටස සඳහා මධ්‍යගත වායු සමීකරණ පද්ධතියක් යටතේ වායු සමනය සිදුවන බැවින් එම හිස් ඉඩ සඳහාද වායු සමනය අඛණ්ඩව ක්‍රියාත්මක වන බව | හත්වන මහල බටහිර අංශයෙහි එක් කොටසක රජයේ විගණන අංශය ස්ථාපිත කර ඇත. ඉතිරි ඉඩ කඩ තොරතුරු තාක්‍ෂණ අංශය සඳහා ලබා දී ඇති නමුත්, පසුගිය වසරේ ලද සීමිත ප්‍රතිපාදන යටතේ අවශ්‍ය ඉදිකිරීම් 100% ක් සම්පූර්ණ කළ නොහැකි විය. මධ්‍යගත වායු සමීකරණ පද්ධතියක් යටතේ වායු සමනය සිදුවන බැවින් හත්වන මහල බටහිර සම්පූර්ණ කොටස සඳහා වායුසමන යන්ත්‍රය ක්‍රියාත්මක | පූර්ණ උපයෝජනය සඳහා විධිමත් පියවර ගැනීම. |

| | | |
|---|---|---|
| තවදුරටත් නිරීක්ෂණය විය. | කෙරෙන බැවින් එම අංශයෙන් එක් කොටසක් සඳහා පමණක් වායුසමීකරණය ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් නොමැත. | |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 34 ක් හෙවත් පුරප්පාඩු 596 ක් පැවතුණ අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 146 ක් හා තෘතියික මට්ටමේ පුරප්පාඩු 147 ක් ඒ අතර විය. | - තෘතියික මට්ටමෙහි අනුමත සංඛ්‍යාලේඛනඥ තනතුරු 200 ක් තුළ ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ තනතුරු 37 ද ඇතුළත්ව ඇති බැවින් බඳවා ගැනීම් කිරීමේදී පුරප්පාඩු සංඛ්‍යාව සලකා ඇත්තේ එම තනතුරු දෙක (02) ම සඳහා ඒකාබද්ධ සේවක සංඛ්‍යාව 200 ක් සේ සලකමිනි.<br><br>- ද්විතියික මට්ටමේ පද්ධති පාලක තනතුරු 4 ක් අනුමතව ඇති අතර නිලධාරීන් දැනට සේවයේ නැත. එම තනතුර දරන්නාට පෞද්ගලික වන සේ හා පසුව අහෝසි වීමට යටත්ව අනුමත කර ඇති බැවින් පුරප්පාඩු නොමැති සේ සලකා ඇත.<br><br>-ද්විතියික මට්ටමේ ජ්‍යෙෂ්ඨ පද්ධති ක්‍රියාකරු තනතුරු 1 ක් අනුමතව ඇති අතර නිලධාරියෙකු දැනට සේවයේ නැත. එම තනතුර දරන්නාට පෞද්ගලික වන සේ හා පසුව අහෝසි වීමට යටත්ව අනුමත කර ඇති බැවින් පුරප්පාඩු නොමැති සේ සලකා ඇත. | අදාල විධිවිධාන පරිදි කටයුතු කර විධිමත් පරිදි පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීම. |

| | | | |
|---|---|---|---|
| | | ද්විතියික මට්ටමේ දත්ත සටහන් ක්‍රියාකරු තනතුරු 5 ක් අනුමතව ඇති අතර නිලධාරීන් 3 දෙනෙක් දැනට සේවයේ යෙදී සිටී. එම තනතුර දරන්නාට පෞද්ගලික වන සේ අනුමත කර ඇති බැවින් පුරප්පාඩු නොමැති සේ සලකා ඇත.<br><br>දෙපාර්තමේන්තුවේ රාජකාරි කටයුතු කරගෙන යාම සඳහා පුරප්පාඩුව පවතින තනතුරු පිරවීම අත්‍යාවශ්‍ය වේ. එබැවින් පුරප්පාඩු පිරවීමට අදාල කටයුතු කරමින් පවතී. | |
| (ආ) | 2018 ජනවාරි 24 දිනැති හා 02/2018 අංක දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ඇමුණුම 02 ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2/2018 ට අනුව දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා මානව සම්පත් සැලස්මක් සකස් කර ගැනීමේ කටයුතු මේ වන විට ආරම්භ කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |